**ලංසු සඳහා ආරාධනයයි.**
**ප්‍රධාන අමාත්‍යාංශය - උතුරුමැද පළාත**

**ව්‍යාපෘතියේ නම : පොළොන්නරුව දීප උයන සංවර්ධනය කිරීම II අදියර.**

01. උතුරුමැද පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් ඉහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් හා යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 100 කි.

02. මෙම ව්‍යාපෘතියට අදාල ලංසු ලියවිලි 2017.07.17 දින සිට 2017.08.07 දින දක්වා සතියේ වැඩ කරනු ලබන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.15.00 දක්වා, උතුරු මැද පළාත් සභා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය, 5 වන මහලේ ස්ථාපිත ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් වෙත රු :- 5,000.00 ක ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව ගෙවා ලබා ගත හැක.

03. සුදුසුකම් සහිත ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය.

I. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අසාදු ලේඛණගත නොවූ අයෙකු සහ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA/ICTAD) ශ්‍රේණිගත කිරීම් යටතේ C 4 හෝ ඉන් ඉහළ ශ්‍රේණියක හා NCCASL ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධව ලියාපදිංචි වී තිබිය යුතුය.

II. පසුගිය වසර 05 තුල සිදු කරන ලද ඉදිකිරීම් වටිනාකමේ සාමාන්‍ය අගය අවම වශයෙන් රුපියල් මිලියන 120 ක් විය යුතුය.

III. ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු ලෙස පසුගිය වසර 05 තුල මෙම ඉදිකිරීම් වල සමාන හෝ සංකීර්ණත්වයෙන් රුපියල් මිලියන 100 කින් යුත් එක් වැඩක් පිළිබඳව හෝ පලපුරුද්ද ලබා තිබිය යුතුය.

04. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, උතුරු මැද පළාත වෙතින් ලබා ගත හැක. ( දුරකථන අංක 025 – 2236428, 025 - 2235332)

05. ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව එම කාර්යාලයේදී පරික්ෂා කරවා ගත හැක.

06. 2017.12.30 දින දක්වා ලංසු වලංගු විය යුතුය.

07. සියළුම ලංසුකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ පවතින මූල්‍ය ආයතනයකින් රුපියල් 1,800,000.00 ක් වටිනා ලංසු සුරක්ෂණයක් ලංසු විවෘත කරන දින සිට දින 119 කට වලංගු වන සේ ඉදිරිපත් කල යුතුය.

08. සම්පූර්ණ කරන ලද ලංසු පත් මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවර වල බහා එම කවර දෙක නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ප්‍රධාන ලේකම්/සභාපති, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් සභා පරිපාලන ගොඩනැගිලි

සංකීර්ණය, උතුරු මැද පළාත, අනුරාධපුර යන ලිපිනයට ලැබීමට සැලැස්වීම හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

09. යෝජිත ව්‍යාපෘතියේ සැලසුම් හා ඉදිකිරීම් කටයුතු නිම කල යුතු කාලය දින 280 කි.

10. ලංසු භාර දීමේ අවසන් දිනය 2017.08.08 පෙ.ව. 11.00 වන අතර ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගී විය හැකිය.

11. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව උතුරු මැද පළාත්අමාත්‍ය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

එච්.එම්.පී.බණ්ඩාර,
ප්‍රධාන ලේකම්/සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පලාත.
පළාත් සභා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය,
හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුර.
දිනය: **2017.07.17**